// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1888/6 - 2014 නොවැම්බර් මස 10 වැනි සඳුදා - 2014.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

52 වැනි වගන්තිය යටතේ වූ නියමය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 52 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ විදුලිබල සහ බලශක්ති විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම,

(අ) මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ඉඩම, විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා වහාම අවශ්‍ය වන බව ; සහ

(ආ) එකී විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, මහජන කාර්යයක් වන බැවින් මහජනතාවගේ පොදු සුභසාධනය සහ ප්‍රතිලාභය සඳහා ඉවහල් වන බව

අදහස් කරන හෙයින්, එකී ඉඩම එම කාර්යය සඳහා අවශ්‍ය වන බවට මෙම නියෝගයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 නොවැම්බර් මස 05 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

***ඉඩමේ මායිම්***

ශ්‍රී ලංකාවේ සබරගමුව පළාතේ, කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, ගල්බොඩ සහ කිනිගොඩ කෝරළයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කවුඩාවුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කවුඩාවුල්ල ග්‍රාමයේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් මැන සාදන ලද 2003.11.29 දිනැති අංක 4951 දරන මානක සැලැස්මෙහි කැබලි අංක 1, 2, 3, 4 සහ 1997.05.15 දිනැති අංක 4300 දරන මානක සැලැස්මෙහි කැබලි අංක 2 සහ 3 න් නිරූපණය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 4, රූඩ් 0, පර්චස් 5.83ක් වූ ඉඩමට මායිම් පහත දැක්වෙන පරිදි වේ :-

1A - G 20571— 50 (2014/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 4300 දරන මානක සැලැස්මෙහි යොම්මානේ කුඹුර අටලාහ, කැබලි අංක 1 සහ අංක 4951 දරන මානක සැලැස්මෙහි අස්වැද්දූම පිල්ලැව, කවුඩාවුල්ල සිට නුවර-කොළඹ පාරට වැටී ඇති පාර ; |
| නැගෙනහිරට | : | අංක 4951 දරන මානක සැලැස්මෙහි කවුඩාවුල්ල සිට නුවර-කොළඹ පාරට වැටී ඇති පාර සහ කැබලි අංක 6 (පාරට වෙන් කර ඇත) ; |
| දකුණට | : | අංක 4951 දරන මානක සැලැස්මෙහි කැබලි අංක 5, 6 (පාරට වෙන් කර ඇත) සහ අංක 4300 දරන මානක සැලැස්මෙහි තිඹිරිගහමුල කුඹුර, ගොන්ගන් ඇල ; |
| බස්නාහිරට | : | අංක 4300 දරන මානක සැලැස්මෙහි කැන්දපිටිය, තිඹිරිගහමුල කුඹුර, ගොන්ගන් ඇල සහ අංක 4951 දරන මානක සැලැස්මෙහි ගොන්ගන් ඇල ; |
| ප්‍රමාණය | : | අක්කර 4, රූඩ් 0, පර්. 5.83 |
| හිමිකම් කියනු ලබන්නේ | : | අරුණ අන්නාසිගල, ලංකා ඉන්දුමතී කෙහෙල්පන්නල සහ තවත් අය. |

11-709

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.